දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCCP/ADM/62/2017
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 21/07/2018
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

චක්‍රලේඛ ලිපි අංක : 02 - 177 / 2018

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ආයතන ප්‍රධානීන්,
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත,

**"ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය - 2018"**

ජාතික පිළිකා දත්ත වාර්තා අනුව (2011) ශ්‍රී ලංකාවේ පුරුෂයින්හට වැළඳුන පිළිකා අතර ප්‍රමුඛතම පිළිකාව මුඛ පිළිකාව වන අතර ගැහැණුන්හට වැළඳුන පිළිකා අතරින් මුඛ පිළිකාව හත්වන ස්ථානය ගනී. ශ්‍රී ලංකාවේ වාර්ෂිකව මුඛ පිළිකා රෝගීන් 2000 පමණ අළුතින් වාර්තා වේ. වර්ෂ 2011දි පිරිමින් සහ කාන්තාවන්ගේ වයස් ප්‍රමානිකෘත නව මුඛ පිළිකා රෝගීන් අනුපාතය (age standardized incidence rates) ජනගහනය 100,000 කට පිළිවෙළින් 16.4 සහ 4.1 වේ. එයට අමතරව සියළුම පිළිකා අතරින් වැඩිම මරණ අනුපාතිකයක් ඇත්තේ මුඛ පිළිකාවට වන අතර, එය දිනකට මරණ 2-3 පමණ වේ.

බුලත්විට සැපීම, දුම්කොළ හා පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය, දුම්පානය සහ මත්පැන් භාවිතය යන අයහපත් පුරුදු වලින් වැළකීම මගින් මුඛ පිළිකා වලක්වා ගත හැකිය. එමනිසා මහජනතාව දැනුවත් කරන වැඩසටහන් පැවැත්වීම, මුඛ පිළිකා සඳහා වැඩි අවදානම් කණ්ඩායම් පරීක්ෂා කිරීමත් මගින් මුඛ පිළිකා ව්‍යසනය අවම කරගත හැකිය. මුඛ පිළිකා මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් ඒවා සුව කරගත හැකි අතර පූර්ව මුඛ පිළිකා අවස්ථාවේදී රෝගය හඳුනාගෙන නිසි පරිදි රෝග කළමනාකරණයෙන් මුඛ පිළිකාව සෑදීම වලක්වාගත හැකිය.

මුඛ පිළිකා වලක්වා ගැනීමට සහ නිවාරණයට මෙම ක්‍රමෝපායන් භාවිතා කලද, වර්ෂ 2010 දී සිදුකරන ලද පිළිකා දත්ත වාර්තාව අනුව මුඛ පිළිකා රෝගීන් වැඩි සංඛ්‍යාවක් (72%) ප්‍රතිකාර සඳහා යොමුවී ඇත්තේ රෝගයේ අවසන් අවධිවලදීය. එබැවින් ඔවුන්ගේ මරණ අනුපාතය වැඩි වීමක් පෙන්නුම් කරයි. මේ සඳහා හේතු විය හැක්කේ අවදානම් කණ්ඩායම් නිසි පරිදි හඳුනාගැනීම සිදු කළ නොහැකි වීම, පූර්ව මුඛ පිළිකා / මුඛ පිළිකා හඳුනාගැනීම සඳහා සිදුකරන පරීක්ෂාවන් සඳහා ඇති පහසුකම්වල දුර්වලතා සහ මහජනතාවගේ නොදැනුවත්භාවයයි.

හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා පාලනය පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය සෑම වර්ෂයකම ජූලි මස 27 ත් වන දින ලොව පුරා සමරනු ලැබේ. හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා අතරින් මුඛ පිළිකාවට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ.

මහජනතාවගේ, පූර්ව මුඛ පිළිකා සහ මුඛ පිළිකාවලට හේතුකාරක වන අවදානම් සාධක පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සහ අවදානම් කණ්ඩායම්වල පූර්ව මුඛ පිළිකා සහ මුඛ පිළිකා හඳුනා ගැනීම සඳහා පවත්වනු ලබන වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා අගෝස්තු මාසය තුල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස ජාතික පිළිකා මර්දන වැඩසටහන සියලුම ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් හට දන්වා සිටී. ඒ සඳහා ප්‍රදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්, වෛද්‍ය නිලධාරී (සැලසුම්), වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග), සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් , දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ සහ ප්‍රථමික සෞඛ්‍ය නිලධාරීන් ගේ සක්‍රීය දායකත්වය ලබා ගන්නා ලෙස දන්වා සිටිමි.

ක්‍රියාත්මක කළහැකි ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සමහරක් පහත දැක්වේ.

1. පළාතේ හෝ දිස්ත්‍රික්කයේ සම්පත් දායකයන්ගේ (උදාහරණ: මුඛ හා හණුක ශල්‍ය වෛද්‍යවරුන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්) සහභාගීත්වයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් සහ පෞද්ගලික සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන් සඳහා දේශන, සාකච්ඡා සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
2. මුඛ පිළිකා සම්බන්ධ අවදානම් සාධක හඳුනා ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් ඇතිව ප්‍රාථමික සෞඛ්‍ය සේවා නිලධාරීන් වෙනුවෙන් පවත්වන සේවාස්ථ පුහුණු කිරීමේ වැඩසටහන්.
3. පාසල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් / කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල, පළාත් පාලන ආයතන ආදී රජයේ ආයතන ප්‍රධානීන් වෙනුවෙන් උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම.
4. රජය සහ පෞද්ගලික ආයතන වල කාර්ය මණ්ඩල සඳහා මුඛ පිළිකා නිවාරණය සහ වැළැක්වීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන්.
5. මුඛ පිළිකා සම්බන්ධ දැනුම වර්ධනය කිරීම සඳහා මහජනතාව ඒකරාශී වන ස්ථානයන්හි (උදාහරණ: දුම්රිය ස්ථාන, බස් නැවතුම් පොළවල්, පොදු වෙළඳ පොළවල්- ඉරිදා පොළ ආදියෙහි) පාගමන් වැනි වැඩසටහන් සංවිධානය කිරීම. එවැනි වැඩසටහන් රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූල සංවිධාන සහ ව්‍යාපාරික සංගම් වැනි සිවිල් සමාජ සංවිධාන හරහා පෞද්ගලික සහ රාජ්‍ය නොවන අංශ වෙත හඳුන්වා දිය හැකිය.
6. දන්ත සායන, සුව දිවි සායන සහ ජංගම සායන වල මුඛ පිළිකා කලින් හඳුනාගැනීමේ වැඩසටහන් වඩා ව්‍යාප්තව සිදු කිරීම.

මෙම වැඩසටහන් සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් ප්‍රදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය වරුන්හට ලබාදී ඇති පත්‍රිකා, පෝස්ටර් වැනි සෞඛ්‍ය අධ්‍යාපන මෙවලම් භාවිතා කල හැකිය. හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය සම්බන්ධයෙන් ඔබ ප්‍රදේශයේ / ආයතනයේ පවත්වන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පිළිකා මර්දන වැඩසටහනෙහි අධ්‍යක්ෂ වෙත 2018 ඔක්තෝම්බර් මස 15 දින හෝ ඊට පෙර ලබා දෙන ලෙස ද දන්වා සිටිමි.

ශ්‍රී ලංකාවේ පවතින මුඛ පිළිකා උවදුර පාලනය කර ගැනීමේ අරමුණ ඇතිව මෙයට පහසුකම් සැලසීමට සහ සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සියලු ම පළාත් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන් වෙත උපදෙස් දෙනු ලැබේ.

මෙම ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනීම උදෙසා ඔබගේ නායකත්වය, උපදෙස් සහ සක්‍රිය දායකත්වය විශේෂයෙන් අගය කරමි.

ඔබට වැඩිදුර විස්තර අවශ්‍ය නම් කරුණාකර වෛද්‍ය ප්‍රසන්න ජයසේකර, විශේෂඥ ප්‍රජා දන්ත වෛද්‍ය, ජාතික පිළිකා මර්දන වැඩසටහන අමතන්න (දුරකථන අංක: 0112 368627).

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග)
අධ්‍යක්ෂ, දන්ත සේවා
අධ්‍යක්ෂ, ප්‍රාථමික සේවා
අධ්‍යක්ෂ, මාතෘ හා ළමා සෞඛ්‍ය
අධ්‍යක්ෂ, සෞඛ්‍ය ප්‍රවර්දන කාර්යාංශය
පළාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්, විශේෂඥ ප්‍රජා දන්ත වෛද්‍යවරුන්
ප්‍රධාන වෛද්‍ය නිලධාරී (පාසල් සෞඛ්‍ය)
සියලුම ප්‍රදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය වරුන්
සියළුම වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග)
සියළුම වෛද්‍ය නිලධාරී (මාතෘ හා ළමා සෞඛ්‍ය)
සියළුම වෛද්‍ය නිලධාරී (සැලසුම්)